## ජාතික සමාජ සංවර්ධන ආයතනය- 2011

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව මූල්‍යමය ස්වරූපයෙන් නොවන රාජ්‍ය ප්‍රදාන, රජයේ ප්‍රදාන (සංචිත) ගිණුමට බැර කළයුතු වුවද, රු. 12,500,000 ක් වූ වාහන 2 ක වටිනාකම එසේ නොදක්වා සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දැනට භාවිතා කරනු ලබන 2008 දෙසැම්බර් 04 දිනට රු.4,125,000 කට ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 05 ක අගයන් 2011 දෙසැම්බර් 31 දිනට ශුන්‍ය වී තිබුණි.

(ආ) කැලණිය ශිෂ්‍ය නේවාසිකාගාරය පිහිටා ඇති හෙක්ටයාර් 0.0322 භූමි ප්‍රමාණයක් ඇති ඉඩම් 02 ක් 2001 ජනවාරි 18 දින මිලදී ගෙන තිබුණි. එම වටිනාකම වූ රු. 2,150,000 ක් ගොඩනැගිලි යටතේ පෙන්වා තිබුණු අතර ඉඩම් හා ගොඩනැගිලි වෙන්වෙන්ව හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් පොළී ආදායම ලෙස ලැබුණු රු. 400,099 ක මුදල, 2011 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත නොකර ජාතික සමාජ සංවර්ධන අරමුදල් ගිණුමට බැර කර තිබුණි. ඒ හේතු කොටගෙන 2011 වර්ෂයේ අලාභය රු. 400,099 ක් වැඩි වී තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ ගොඩනැගිලි සඳහා 2011 වර්ෂයේදී ක්ෂය ලෙස කපාහැරිය යුතු වටිනාකම රු.401,224 ක් වුවත් රු.405,902 ක් කපාහැරීම නිසා වර්ෂයේ අලාභය රු. 4,678 කින් වැඩිවී තිබුණි.

(ඉ) 2011 වර්ෂය තුලදී ආයතනයට පරිත්‍යාග ලෙස ලැබී තිබූ පොත් 199 ක වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂ නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්තිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් | | |
| තලාව ඉඩම | - | දීර්ඝ කාලීන බලපත්‍රය |
| කාර්යාලීය උපකරණ | 11,819,162 | (i) ස්ථාවර වත්කම් ලේඛණය<br>(ii) විස්තරාත්මක උපලේඛණ |
| යන්ත්‍ර | 10,410,969 | |
| මෙවලම් සහ වෙනත් | 186,620 | |
| (ආ) ණය හිමියන් | 1,838,561 | ණය හිමි ලේඛණය |

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.262 (2) හා (3) | ගෙවන ලද සියලුම වවුචරවලත් ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලත් "ගෙවන ලදි" මුද්‍රාව යෙදිය යුතු අතර මුදල් පොතෙහි සටහන් කොට ඇති ගෙවූ දිනය, ගෙවීම් නිලධාරියාගේ කෙටි අත්සන මෙම මුද්‍රාවෙහි යෙදිය යුතු වුවද ආයතනයේ ගෙවීම් සම්බන්ධයෙන් එසේ කටයුතු නොකළ අවස්ථා පැවතුණි. |

| | | |
|---|---|---|
| (ii) | මු.රෙ. 1645 (අ) | වාහන වල ලොග් පොත් යාවත්කාලීන කර නිසියාකාරව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති හා අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 ජේදය | පරිගණක හා උපාංග මිලදී ගැනීමේදී අදාල ආකෘති පත්‍ර සම්පූර්ණ කර නොගෙන ගෙවීම් නොකළ යුතු වුවද, ආයතනය විසින් රු.303,000 කට මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 03 සම්බන්ධව චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 9,445,973 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 7,596,610 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌණතාවයේ රු. 1,849,363 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. වියදම වැඩිවීම මීට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනය විසින් 2011 වර්ෂය තුලදී ඉටුකිරීමට බලාපොරොත්තු වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව පිළියෙල කරන ලද කාර්ය සාධන වාර්තා විවිධ අංශ විසින් මාසිකව පිළියෙල කරන ලද අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්තු අවසානයේදී හා වර්ෂය අවසානයේදී එක් කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) සහ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ මාධ්‍යය) විෂය නිර්දේශ පිළිවෙලින් වර්ෂ 10කින් හා 9 කින් සංශෝධනය කර නොතිබුණි.

(ඈ) ආයතනය විසින් අධ්‍යයන, පුහුණු හා සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන වශයෙන් අංශ 3 කින් සමන්විත වන නමුත් එම අංශවල සියලු වියදම් වෙන්කිරීමකින් තොරව ගිණුම් තැබීම හේතුවෙන් 2011 වර්ෂයේදී එක් එක් අංශවල මූල්‍ය කාර්ය සාධනය වෙන් වෙන්ව ඇගයීම කල නොහැකි විය.

(ඉ) **අධ්‍යයන කටයුතු**

ආයතනයේ අධ්‍යයන හා පුහුණු අංශයන් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලා 04 ක් සඳහා සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා පුහුණු අංශ සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේදී පාඨමාලා සඳහා බඳවා ගත හැකි සිසුන් සංඛ්‍යාව 1362 ක් ව පැවතියදී, සිසුන් 1075 ක් පමණක් බඳවා ගෙන තිබුණි. තවදුරටත් සිසුන් 287 දෙනෙකු බඳවා ගැනීමට හැකි අතර එම බඳවා නොගත් ප්‍රමාණය මුළු බඳවා ගත හැකි සිසුන් ප්‍රමාණයෙන් 21% ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ii) අධ්‍යයන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 58 දෙනෙකු වන නමුත් සත්‍ය කාර්ය මණ්ඩලය 24 දෙනෙකු වූ අතර එම කාර්ය මණ්ඩලයෙන් දෙදෙනෙකු 2010 වර්ෂයේ සිට අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී තිබුණි. ඒ අනුව 2011 වර්ෂයේදී අධ්‍යයන අංශයේ 62% පුරප්පාඩු පැවතුණි.

3.2 **තලාව පුහුණු මධ්‍යස්ථානය උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනය අනුරාධපුර තලාවේදී පවත්වාගෙන යාමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි රු.මිලියන 16 ක් වැය කර 2002 මාර්තු 31 දින ඉදිකර අවසන් වුවත් එම ආයතනය එහි ස්ථාපිත නොකර නාවල කොස්වත්තේ පිහිටි කුලී ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුලදී රු.1,243,200 ක් කුලී ගෙවා තිබුණි. මෙසේ කුලී ගොඩනැගිල්ලක ආයතනය පවත්වාගෙන යාම, විවිධ කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් 1998 වර්ෂයේදී නාවල පිහිටි අක්කර 2 ක භූමි ප්‍රමාණයක් ආයතනය විසින් අත්හැරීම හා ආයතනය තලාව ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණු ඉටු නොවීම හේතුවී ඇති බව නිරීක්ෂණය විය. 2010 මාර්තු මාසය වන විට තලාව ගොඩනැගිල්ල නිමවා වසර 08 ක පමණ කාලයක් ගත වන විට එම ගොඩනැගිල්ල ඉරිතලා විශාලපැලීම් සහිත තත්වයකට පත්වී ඇති බව වාර්තා වී ඇති බැවින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සාර්ථක තත්ත්වයක නොපවතින බව නිරීක්ෂණය කෙරේ.

(ආ) තලාව ගොඩනැගිල්ල දැනට පුහුණු ආයතනයක් ලෙස රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල වැඩ සටහන් පැවැත්වීමට හා ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් සති අන්ත දිනවල උපදේශන පාඨමාලා පැවැත්වීමට යොදා ගනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසය තෙක් දරන ලද වියදම රු 765,669 වූ අතර ලැබුණු ආදායම රු. 570,110 ක් විය.

(ඇ) ජනවාරි සිට ඔක්තෝබර් අතර දින 293 ක කාලය තුල වැඩසටහන් පවත්වා තිබුණේ දින 109 ක් තුල බැවින් එම කාලයට අදාලව දින 184 ක් හෙවත් 62% කාලයක් අදාල ආයතනයේ කාර්යයන් සඳහා යෙදවී නොතිබුණි.

### 3.3 කාර්ය මණ්ඩලය

2011දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| කාර්ය මණ්ඩල විස්තරය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | පුරප්පාඩු ප්‍රතිශතය |
|---|---|---|---|---|
| අධ්‍යයන | 58 | 24 | 34 | 59 |
| අනධ්‍යයන | 57 | 48 | 09 | 16 |
| එකතුව | 115 | 72 | 43 | 37 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලය 37 % ක් පුරප්පාඩු වී තිබුණි.

(ආ) අධ්‍යයන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 58 දෙනෙකු වන නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටි කාර්ය මණ්ඩලය වූයේ 24 දෙනෙකු පමණි. එ බැවින් එය අධ්‍යයන අංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 41% ක් පමණක් වූ අතර එම කාර්ය මණ්ඩලයෙන් දෙදෙනෙකු 2010 වර්ෂයේදී අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී තිබුණි. එබැවින් 2011 වර්ෂයේදී අධ්‍යයන අංශයේ 62% ක් පුරප්පාඩු පැවතුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

2011 ඔක්තෝබර් 17 දින අභ්‍යන්තර විගණන තනතුර සඳහා නිලධාරිනියක් බඳවාගෙන තිබුණ නමුත් විගණන අවස්ථාව වන විටත් අභ්‍යන්තර විගණන අංශයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ලබා දී නොතිබුණි.

## 4.2 අය වැය ලේඛණමය පාලනය

අයවැය ලේඛණයේ සංශෝධිත ඇස්තමේන්තු වල සඳහන් ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් අතර 11% සිට 100% ක පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛණය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ශිෂ්‍යාධාර ගෙවීමේ

(ආ) අත්තිකාරම් පියවීම